අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. } ED/1/6/1/

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2023. 11. 17

සියලුම විදුහල්පතිවරුන් වෙත

**<u>අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2023</u>**
**<u>(2023. 04. 25 දිනැති 17/2023 චක්‍රලේඛය අනුව)</u>**

චක්‍රලේඛ අංක 17/2023 අනුව 2023 වසරේ දී අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමේ පළමු වටය 2023. 05.15 දිනැතිව පුරප්පාඩු ප්‍රසිද්ධ කර ආරම්භ කරන ලද අතර, විදුහල්පතිවරුන් විසින් සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉදිරිපත් කරන ලද තෝරාගත් ශිෂ්‍ය ලැයිස්තු සඳහා අනුමැතිය ලබාදීම 2023. 10. 05 දිනෙන් අවසන් කෙරිණ. ඒ අනුව මින් ඉදිරියට පළමු වටයේ ශිෂ්‍ය ලැයිස්තු සඳහා අනුමැතිය ලබාදීම සිදු කරනු නොලැබේ.

02. 2023 වර්ෂයේ දෙවන වටය ආරම්භ කිරීම සඳහා විදුහල්පතිවරුන් විසින් දැනුම් දෙන ලද 2023. 10. 20 දිනට ඒ ඒ පාසලේ එක් එක් ශ්‍රේණිය සඳහා පවතින පුරප්පාඩු අමාත්‍යාංශ වෙබ් අඩවියේ 2023. 11. 16 දින පලකර ඇත. ඒ අනුව, **2023. 10. 20 දිනට පවතින පුරප්පාඩු අමාත්‍යාංශය වෙත දැනුම් දෙන ලද පාසල් සඳහා පමණක්** පාසල් මට්ටමින් පුරප්පාඩු ප්‍රසිද්ධ කර 17/2023 චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුගමනය කරමින් ඉදිරි කටයුතු ආරම්භ කිරීමට අනුමැතිය ලබාදෙනු ලැබේ.

03. සියළුම විදුහල්පතිවරුන් 2023. 10. 20 දිනට අනුමත කරගන්නා ලද පුරප්පාඩු පාසල් මට්ටමින් ප්‍රසිද්ධ කර අයදුම්පත් කැඳවිය යුතු වේ. අයදුම්පත් කැඳවීමේ දී සති දෙකක කාලයක් ලබාදිය යුතු අතර, කලාප අධ්‍යක්ෂ වෙතින් අනුමත කරගන්නා ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් චක්‍රලේඛයෙහි සඳහන් නිර්ණායකයන්ට අනුකූලව සම්මුඛ පරීක්ෂණ පවත්වා, තෝරාගත් ශිෂ්‍ය ලැයිස්තුව 2023. 12. 15 දිනට පෙර අනුමැතිය සඳහා මා වෙත ඉදිරිපත් කළයුතු වේ.

04. අනුමැතිය සඳහා තෝරාගත් ශිෂ්‍ය නාමලේඛන එවීමේ දී විවිධ අඩුපාඩු නිරීක්ෂණය වන බැවින්, අනවශ්‍ය ප්‍රමාදවීම් වලක්වාගැනීම සඳහා ඇමුණුම 01 හි සඳහන් උපදෙස් කරිදි කටයුතු කරන මෙන් ද සියළුම විදුහල්පතිවරුන් වෙත දැනුම් දෙනු ලැබේ.

**පී. ඒ. එස්. පී. ජයලත්**
අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)

අත්/කලේ
**එම්. එන්. රණසිංහ**
අධ්‍යාපන ලේකම්

g:\chami\letter to principals - 2023. 11. 02.docx



CamScanner

**<u>2023. 04. 25 දිනැති 17/2023 චක්‍රලේඛ ප්‍රකාරව අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2023</u>**

➢ **තෝරාගත් ශිෂ්‍ය ලැයිස්තු අනුමැතියට ඉදිරිපත් කිරීමේදී සම්පූර්ණ කළයුතු නිර්ණායක**

1) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ අනුමැතිය ලබාගත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනය. **(චක්‍රලේඛයේ 3.4.3 වගන්තිය අනුව)** මෙහිදී පෙර අනුමත කරගත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වලංගු නොවන අතර, නව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් අනුමත කරගත යුතු වේ.

2) පාසලේ එක් එක් ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රසිද්ධ කළ බවට තහවුරුව. (පාසල් වෙබ් අඩවියේ හෝ පාසල් දැන්වීම් පුවරුවේ හෝ වෙනයම් පිළිගත් ක්‍රමවේදයක් අනුගමනය කළ බවට වන සහතිකය) **(චක්‍රලේඛයේ 3.2 වගන්තිය අනුව)**

3) එක් එක් ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව, අයදුම්පත් ලද සංඛ්‍යාව, සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද සංඛ්‍යාව සහ තෝරාගන්නා ලද සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් පැහැදිලිව. (චක්‍රලේඛයේ 3.4.2 **වගන්තිය අනුව)**

4) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සහතික කරන ලද ;

- සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන ලද සියලුම අයදුම්කරුවන්ගේ ලැයිස්තුව.( ලබාගත් ලකුණු ද සමඟින් අනුපිළිවෙලට සකස්කර)
- ඒ අතරින් පුරප්පාඩු සංඛ්‍යාවට අනුව තෝරාගත් ශිෂ්‍ය ලැයිස්තුව. (පළාත් පාසල්සහ ජාතික පාසල් සිසුන් දෙවර්ගයම ඇතුළත් වන පරිදි ලබාගත් ලකුණු ද සමඟින් අනුපිළිවෙලට සකස් කරන ලද)
- එම තෝරාගත් ශිෂ්‍ය ලැයිස්තුවෙහි දැනට ජාතික පාසලක ඉගෙනුම ලබන සිසුන් වේ නම් එම සිසුන් පමණක් ඇතුළත් කර සකස් කරන ලද වෙනම ලැයිස්තුව

(චක්‍රලේඛයේ 3.5 (ඈ) වගන්තිය අනුව) **ඉහත ලැයිස්තුවල එක් එක් සිසුවා දැනට ඉගෙනුම ලබන පාසල සහ එම සිසුවා විසින් සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය සඳහන් කර තිබීම අත්‍යාවශ්‍ය වේ. එසේම ලකුණු ලේඛනයේ දරුවාගේ උපන් වර්ෂය (උප්පැන්න සහතිකය අනුව තහවුරු කරගෙන) සඳහන් කළයුතු වේ.**

5) චක්‍රලේඛයේ 5.0 (අ) වගන්තිය අනුව, ජාතික පාසලකින් ජාතික පාසලකට සිසුන් ඇතුළත් කිරීම අත්‍යාවශ්‍ය හේතුවක් මත පමණක් අධ්‍යාපන ලේකම් විසින් තීරණය කර සිදුකළ යුතුය. එබැවින් ඉහත තෝරාගත් ශිෂ්‍ය ලැයිස්තුවෙහි **ජාතික පාසලකින් ජාතික පාසලකට ඇතුළත් කිරීම්** වේ නම් පහත පරිදි කටයුතු කළයුතු වේ.

i. ජාතික පාසලකින් සිදුකරන ඇතුළත් කිරීම් සඳහා තෝරාගත් සිසුන් අමුණා ඇති ආකෘතිය 01 අනුව <u>වෙනම ලැයිස්තුවක්</u> මඟින් ඉදිරිපත් කළ යුතුය. **(චක්‍රලේඛයේ 5.0 (අ) වගන්තිය අනුව අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතියට ඉදිරිපත් කළයුතු බැවින්)**

ii. එම සිසුන් තෝරාගැනීමට හේතු විදුහල්පති විසින් සාධාරණීකරණය කර තිබිය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය තහවුරු කිරීම් ලේඛන අමුණා එවිය යුතුය.

iii. ආකෘතියට අනුව සකස් කරන ලද තෝරාගත් ශිෂ්‍ය ලැයිස්තුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් විධිමත් පරිදි සහතික කර තිබිය යුතුය. (සෑම පිටුවක්ම)

iv. එම තහවුරු කිරීමේ ලේඛන අවශ්‍ය අවස්ථාවක දී ඉදිරිපත් කිරීම සඳහා පිටපත් කට්ටලයක් ඔබ වෙත තබාගත යුතුය.



ගරු අමාත්‍යතුමා
கௌரவ அமைச்சர்
Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම්
செயலாளர்
Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

CamScanner

ආකෘතිය 01

# ජාතික පාසලකින් ජාතික පාසලකට ඇතුළත් කිරීම් සඳහා තෝරාගත් ශිෂ්‍ය ලැයිස්තුව

| අනු අංකය | ශ්‍රේණිය | දරුවාගේ නම | මව/පියා/භාර කරුගේ නම | ලිපිනය | දැනට ඉගෙනුම ලබන පාසල | ලබාගත් ලකුණු | තෝරා ගැනීම සාධාරණී කරණය කිරීමට හේතු | තහවුරු කිරීමේ ලේඛන (පිටපත් අවශ්‍ය වේ) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

ඉහත තෝරාගත් ශිෂ්‍ය ලැයිස්තුව නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමු.

**සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය**

**සභාපති**

නම තනතුර අත්සන නිල මුද්‍රාව

**සාමාජික**

නම තනතුර අත්සන නිල මුද්‍රාව

**සාමාජික**

නම තනතුර අත්සන නිල මුද්‍රාව

**සටහන**

1. ඉහත තෝරාගත් ලැයිස්තුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සහතික කර අත්සන් කර තිබිය යුතුය.
2. ආවරණ ලිපියෙහි "තෝරාගත් ශිෂ්‍ය ලැයිස්තුව නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි" යන කරුණ ඇතුළත් විය යුතුය.



ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832, +94112784825, minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary — +94112784811, +94112785162